සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I
தொடர்பாடலும் ஊடகக் கற்கையும் I
Communication and Media Studies I

29 S I

2019.08.30 / 0830 - 1030

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

**උපදෙස්:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* **1** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක්** (X) යොදා දක්වන්න.

---

1. ජනමාධ්‍යයන්ගේ පැවැත්ම සඳහා මූලික ව අවශ්‍ය වන්නේ කුමක් ද?
(1) අදහස් (2) සංවිධාන (3) ආයතන (4) තොරතුරු (5) සාක්ෂරතාව

2. සන්නිවේදන ආකෘතියක් තුළ දී ආකල්ප පිළිබඳව විවරණය කරන්නේ,
(1) ඩේවිඩ් කේ. බර්ලෝ ය. (2) ෂැනන් හා වීවර් ය.
(3) විල්බර් ශ්‍රාම් ය. (4) හැරල්ඩ් ඩී. ලැස්වෙල් ය.
(5) චාල්ස් ඔස්ගුඩ් ය.

3. ගුරුවරයා පන්තියේ දී භාවිත කළ වචන කිහිපයක අර්ථය වටහා ගත නොහැකි වූ සිසුහු විශ්වකෝෂය පෙරළා බැලූහ. මෙම අවස්ථාවේ සිසුන්ගෙන් සිදු වූයේ,
(1) අර්ථකථනයකි. (2) ආකේතිකරණයකි.
(3) විකේතිකරණයකි. (4) පරිවර්තනයකි.
(5) විශ්ලේෂණයකි.

4. රටක විකල්ප මාධ්‍ය භාවිතය ප්‍රචලිත වීමට ප්‍රධානතම හේතුව වන්නේ,
(1) නව මාධ්‍ය ප්‍රබල වීමයි. (2) සාක්ෂරතාව ප්‍රබල වීමයි.
(3) නිදහස් මාධ්‍ය භාවිතයයි. (4) අධිපතිවාදී මාධ්‍ය ප්‍රවණතාවයි.
(5) මුද්‍රණ කටයුතු පහසු වීමයි.

5. සාමාන්‍ය ජීවිතයේ දී පුද්ගලයෙකුගේ සන්නිවේදන ධාරිතාවෙන් වැඩි ප්‍රමාණයක් වැය වන්නේ,
(1) ශ්‍රවණයට ය. (2) කථනයට ය.
(3) පාඨනයට ය. (4) ලේඛනයට ය.
(5) රූපණයට ය.

6. අවාචික සන්නිවේදයේ ලක්ෂණයක් **නොවන්නේ**,
(1) අඛණ්ඩ ක්‍රියාවලියක් වීමයි. (2) පුද්ගලබද්ධතාවෙන් තොර වීමයි.
(3) විවිධ ක්‍රම යොදාගත හැකි වීමයි. (4) අචේතනිකව ද සිදු වීමයි.
(5) පොදු රීතියක් නොමැති වීමයි.

7. සංවර්ධන සන්නිවේදනය සඳහා පූජකතුමා, වෙද මහතා සහ සංවර්ධන නිලධාරි මහතා හවුල්කර ගැනීම මගින් පැහැදිලි වන්නේ,
(1) සහභාගිත්ව ප්‍රවේශයයි. (2) පුද්ගල ප්‍රතිරූපයයි.
(3) ප්‍රජා මාධ්‍ය ප්‍රවේශයයි. (4) දෙපියවර සංකල්පයයි.
(5) ග්‍රාහක කේන්ද්‍රීය ප්‍රවේශයයි.

[ දෙවැනි පිටුව බලන්න.

**08.** වෙරළබඩ ගම්මානයක ජනතාවට සුනාමි අනතුරක දී ඉතා ඉක්මනින් හා පුළුල් ලෙස අනතුරු ඇඟවීමක් කළ හැකි වන්නේ,

(1) ලිඛිත සන්නිවේදනයෙනි. (2) දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(3) ශ්‍රව්‍ය සන්නිවේදනයෙනි. (4) ශ්‍රව්‍ය-දෘශ්‍ය සන්නිවේදනයෙනි.
(5) ලිඛිත-දෘශ්‍ය සන්නිවේදනයෙනි.

**09.** කෙටිකාලීන මතකයේ ඇති කරුණු දිගුකාලීන මතකය කරා රැගෙන යාමට බලපාන ප්‍රධාන සාධකයක් **නොවන්නේ**,

(1) අවධාරණයයි. (2) භාවිතයයි.
(3) ආවර්ජනයයි. (4) පරිකල්පනයයි.
(5) අභ්‍යාසයයි.

**10.** නිර්මාණකරුවෙකුට තම නිර්මාණ ජනතාවට හැඟෙන පරිදි ඉදිරිපත් කළ හැකි වන්නේ,

(1) භාෂාත්මක අවබෝධයෙනි. (2) තේමාව ගැන අවබෝධයෙනි.
(3) සහවේදනයෙනි. (4) සංජානන ශක්තියෙනි.
(5) ජනවිඥානය ගැන අවබෝධයෙනි.

**11.** පාසලේ ගුරු මණ්ඩලය ඔවුනොවුන් අතර සහයෝගිතාව පවත්වා ගනිමින් කණ්ඩායම් හැඟීමකින් යුක්ත ව වෙහෙස නො බලා කටයුතු කිරීමෙන් පාසලේ විභාග ප්‍රතිඵල වාර්තාගත ලෙස ඉහළ දැමීමට සමත් වූහ. ඔවුන්ගේ සාර්ථකත්වය පිටුපස ඇත්තේ,

(1) වගකීමයි. (2) වගවීමයි.
(3) යුතුකමයි. (4) සුහදත්වයයි.
(5) සහානුභූතියයි.

**12.** අරමුණු, වගවීම හා සුසංයෝගය වැනි කරුණු පිළිබඳ ව සංසන්දනාත්මක ව සලකා බලන විට වඩාත් ම වගකීම් සහිත සන්නිවේදන ප්‍රභේදය කුමක් ද?

(1) සමූහ සන්නිවේදනය (2) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය
(3) පුද්ගලාන්තර සන්නිවේදනය (4) ජන සන්නිවේදනය
(5) මහජන සන්නිවේදනය

**13.** සන්නිවේදන ක්ෂේත්‍රය වෙළෙඳපොළ රීතීන්ට අනුව සකස් විය යුතුය යන අදහස මුලින් ම අවධාරණය කරන ලද්දේ,

(1) අධිපතිවාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(2) නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(3) සමාජ ප්‍රජාතන්ත්‍රිකරණ සන්නිවේදන සංකල්පය මගිනි.
(4) සෝවියට් කොමියුනිස්ට්වාදී සන්නිවේදන සංකල්පය මගිනි.
(5) සමාජ වගකීම් සන්නිවේදන සංකල්පය මගිනි.

**14.** සන්නිවේදනය යන සංකල්පයේ මූලික ම අර්ථය වන්නේ,

(1) තොරතුරු හුවමාරු කර ගැනීම ය.
(2) සන්දේශ සම්ප්‍රේෂණය කිරීම ය.
(3) පුද්ගල අන්තර් ක්‍රියාකාරිත්වය ය.
(4) යම් දෙයක් තවත් කෙනෙකුට දැනුම් දීම ය.
(5) හුදකලා වූ පාර්ශ්ව අතර සම්බන්ධතා ඇති කිරීම ය.

**15.** ජන ඇදහිලි පිළිබඳ විමර්ශනය කිරීමේ දී පහත සඳහන් ප්‍රකාශවලින් **අසත්‍ය** වන්නේ,

(1) සමාජ යථාර්ථයෙන් යුක්ත වීම ය.
(2) සමාජ පැවැත්මට අවශ්‍ය බව සැලකීම ය.
(3) ආගම්වලින් බැහැර ව නොපැවතීම ය.
(4) නැගෙනහිර රටවල බහුල ව පැවතීම ය.
(5) විශ්වාසයෙන් බැහැර ව නොපැවතීම ය.

[ තුන්වැනි පිටුව බලන්න.

16. ශ්‍රී ලංකාවේ අභිගුණ්ඨික ජන කණ්ඩායම් ලාංකේය සංස්කෘතික සම්ප්‍රදායයන් අවශෝෂණය කරගෙන ඇති බවක් දක්නට ලැබේ. මෙය,
(1) සංස්කෘතික විසරණයකි. (2) සංස්කෘතික ත්වරණයකි.
(3) සංස්කෘතික කම්පනයකි. (4) සංස්කෘතික ලැග්මකි.
(5) පාරසංස්කෘතිකකරණයකි.

17. සංවර්ධන සන්දේශ ප්‍රවර්ධන කාර්යයේ ලක්ෂණයක් **නොවන්නේ,**
(1) විශේෂඥ නියාමනයක් අවශ්‍ය වීමයි.
(2) සැලැස්ම පිළිබඳ සෑම දෙයක්ම දැන සිටීමයි.
(3) කාල රාමුවක් රහිත ව ක්‍රියා කිරීමයි.
(4) ග්‍රාහක ප්‍රතිචාර ලබා ගැනීමට කටයුතු කිරීමයි.
(5) තක්සේරු කිරීමේ වැඩපිළිවෙළක් පැවතීමයි.

18. "ඔබගේ ප්‍රකාශනයේ ව්‍යුහාත්මක ලක්ෂණ විශද වන්නේ ප්‍රගල්භ වූ විදග්ධ ජනයාට ය"
ඉහත වාක්‍යය ගුරුවරයකු විසින් පස්වන ශ්‍රේණියේ සිසුන්ට ලබා දී තිබුණි. සන්නිවේදන විෂය අනුව මෙය හැඳින්විය හැක්කේ,
(1) ගැඹුරු වාක්‍යයක් ලෙසට ය. (2) වාක්‍ය වින්‍යාස දෝෂයක් ලෙසට ය.
(3) අර්ථ බාධකයක් ලෙසට ය. (4) ශාස්ත්‍රීය ප්‍රකාශනයක් ලෙසට ය.
(5) අත්දැකීම් පසුතලයේ දෝෂයක් ලෙසට ය.

19. ජනශ්‍රුතිය පොතපතින් නො ව මුඛ පරම්පරාවෙන් පැවත එන බව පැහැදිලි ලෙස පෙන්වා දෙන ලද පළමු ශ්‍රී ලාංකේය විද්වතා වන්නේ,
(1) මාර්ටින් වික්‍රමසිංහ ය. (2) ආනන්ද කුමාරස්වාමි ය.
(3) නන්දසේන රත්නපාල ය. (4) රැල්ෆ් පීරිස් ය.
(5) කාර්තිකේසු සිවතම්බි ය.

20. මාධ්‍ය සාක්ෂරතාව මගින් මූලික ව ම ප්‍රවර්ධනය කිරීමට උත්සාහ කරන්නේ කුමක් ද?
(1) සන්දේශ විචාරය කිරීමේ හැකියාව
(2) සන්දේශ නිර්මාණය කිරීමේ හැකියාව
(3) සන්දේශ විනිශ්චය කිරීමේ හැකියාව
(4) සන්දේශ ග්‍රහණය කිරීමේ හැකියාව
(5) සන්දේශ අර්ථකථනය කිරීමේ හැකියාව

21. පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - සංවර්ධනයේ පදනම ජනමාධ්‍ය බැවින් ඒවා සැලසුම් සහගත ව භාවිත කළ යුතු ය.
B - සමාජයේ සෑම ඓතිහාසික වෙනස්වීමක් ම පන්ති අරගලයේ බලපෑමට හසු වී ඇත.
C - කාර්මික සංවර්ධනය සමග කම්කරු ශ්‍රමික පන්තියක් බිහි විය.
D - නව ව්‍යාපාරික පන්තිය ගොවි කම්කරු ජනතාව පීඩාවට පත් කරයි.
ඉහත ප්‍රකාශ අතුරෙන් සමාජ විග්‍රහය පිළිබඳ මාක්ස්වාදී ප්‍රවේශයට අනුව නිවැරදි වන්නේ
(1) A හා B පමණි. (2) B හා C පමණි. (3) C හා D පමණි.
(4) A, B හා C පමණි. (5) B, C හා D පමණි.

22. විවිධ සේවා සමුපකාර සමිති ක්‍රමයේ දී විවිධ සේවා යන්නට අයත් වනුයේ,
(1) සලාක ලබා දීම, සහනාධාර ලබා දීම, නිෂ්පාදන සිදු කිරීම හා භාණ්ඩ අලෙවි කිරීම ය.
(2) සැලසුම් කිරීම, කාර්ය බෙදා ගැනීම, වැඩ කිරීම හා නියාමනය ය.
(3) නිෂ්පාදිතය, මිල, ස්ථානය හා ප්‍රවර්ධනය ය.
(4) නිෂ්පාදනය, ප්‍රවර්ධනය, ප්‍රචාරණය හා අලෙවිය ය.
(5) නිෂ්පාදනය, අලෙවිය, බෙදාහැරීම හා මිලදී ගැනීම ය.

23. සන්දේශයක් නිර්මාණශීලී ව ඉදිරිපත් කිරීමේ දී සැලකිල්ල දැක්විය යුතු ක්‍රමෝපායක් වශයෙන් ගත **නොහැක්කේ,**
(1) ග්‍රාහකයාට පහසුවෙන් සංජානනය කළ හැකි වීමයි.
(2) ග්‍රාහකයාගේ මානසික උද්දීපනයක් ඇති කිරීමට හැකි වීමයි.
(3) ග්‍රාහකයාට හුරුපුරුදු ආකෘතියක් භාවිත කිරීමයි.
(4) ග්‍රාහකයාට ප්‍රීතිය හා ජීවිතාවබෝධය ලබා දීමයි.
(5) ග්‍රාහකයාගේ සාක්ෂරතා හැකියාව සමග ගැළපීමයි.

**24.** නිර්මාණකරුවෙකුට සිය ස්වීයත්වය පවත්වා ගැනීම වඩාත් පහසු වන්නේ,
(1) කවි ගායනයේ දී ය.
(2) චිත්‍රකරණයේ දී ය.
(3) සිනමා නිර්මාණකරණයේ දී ය.
(4) වේදිකා නාට්‍යයේ දී ය.
(5) රූපවාහිනී මාලා නාට්‍යයක දී ය.

**25.** නිදහස් මතවාදී සන්නිවේදන සංකල්පය සංවර්ධනය කිරීමට දායක වූ චින්තකයන් පමණක් ඇතුළත් වන වරණය තෝරන්න.
(1) ජෝන් බෙන්තම්, ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ඩ් මිල්
(2) ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ඩ් මිල්, නිකොලායි මැකියාවෙලි, කාල් මාක්ස්
(3) නිකොලායි මැකියාවෙලි, ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, තෝමස් හොබ්ස්
(4) ජෝන් ලොක්, ජෝන් මිල්ටන්, ජෝන් ස්ටුවර්ඩ් මිල්, ෆෙඩ්රික් හේගල්
(5) තෝමස් හොබ්ස්, ඇඩම් ස්මිත්, ෆෙඩ්රික් හේගල්, ජෝර්ජ් ගර්බ්නර්

**26.** **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.
(1) මානසික පීඩාව යනු අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන ලක්ෂණයකි.
(2) හිතමිතුරන් අහිමිවීම නිසා ක්ලමථය ඇති විය හැකි ය.
(3) තමා මෙන් ම අනෙකා ද නිවැරදිය සිතීම හඳුන්වන්නේ ධ්‍රැවගත වීම ලෙස ය.
(4) අධික ලෙස ආහාර ගැනීමේ පුරුද්ද කාංසාවේ ලක්ෂණයකි.
(5) තම වැඩවල ඉලක්ක සපුරා ගත නොහැකි වීමෙන් ආතතිය ඇති විය හැකි ය.

**27.** භාෂා භාවිතය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහතින් දැක්වේ.
A - ආත්ම ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ හැකියාව.
B - පුද්ගල බද්ධ සංසිද්ධියක් වීම.
C - පෞද්ගලික දෘෂ්ටිකෝණයක් අවශ්‍ය වීම.
ඉහත ප්‍රකාශවලට අනුරූප භාෂා භාවිත ප්‍රභේද අනුපිළිවෙළින් දැක්වෙන වරණය කුමක්ද?
(1) භාෂණය, විවරණය, ලේඛනය
(2) රූපණය, ලේඛනය, විවරණය
(3) කථනය, රූපණය, භාෂණය
(4) භාෂණය, රූපණය, විවරණය
(5) ලේඛනය, භාෂණය, කථනය

**28.** ලෝකයේ විවිධ ජන වර්ග සහ ජාතීන්ගේ ආධ්‍යාත්මික සංස්කෘතියට පමණක් අයත් කරුණු අඩංගු වන වරණය කුමක් ද?
(1) ආගම, කලාව, පුරාණෝක්තිය, දේශපාලනය
(2) ආර්ථිකය, තාක්ෂණය, විද්‍යාව, කලාව
(3) කලාව, ආගම, දර්ශනය, පුරාණෝක්තිය
(4) දර්ශනය, පුරාවිද්‍යාව, කලාව, ආගම
(5) ආර්ථිකය, පුරාවිද්‍යාව, පුරාණෝක්තිය, විද්‍යාව

**29.** ගෝලීයකරණ ක්‍රියාවලියේ පූර්ව කොන්දේසියක් වන්නේ,
(1) තාක්ෂණික ක්‍රියාවලිය ප්‍රතික්ෂේප කිරීම ය.
(2) පවුල සහ ජාතික වටිනාකම්වලට ප්‍රමුඛත්වය දීම ය.
(3) වාර්ගික සංවෘත්තභාවය ය.
(4) උපරි ජාතික ආයතන නිර්මාණය කිරීම ය.
(5) සන්නිවේදන ක්‍රියාවලියේ ව්‍යාප්තිය ය.

**30.** භාෂා සංස්කෘතියට අයත් **නොවන්නේ**,
(1) උත්සව අවස්ථාවලට අදාළ කටයුතු ය.
(2) දාර්ශනික පයීන නිර්මාණය සහ පාඨනය ය.
(3) මිනිසා සම්බන්ධයෙන් පරිබාහිර ස්වභාවික වස්තු ය.
(4) මානව සමාජ චර්යාවලට අදාළ ක්‍රියාකාරකම් ය.
(5) ආත්මකථනය හා සම්බන්ධ සන්නිවේදන ක්‍රියා ය.

**31.** පොලිස් මහජන සම්බන්ධතා සහ අපරාධ වැළැක්වීමේ කාර්යාංශයට අයත් කාර්යයන් පිළිබඳ ව මතු වූ අදහස් කිහිපයක් පහත දැක්වේ.

A - පාසල් සිසුන් දැනුවත් කිරීමට දේශන පැවැත් වීම.
B - ආගමික උත්සවවලදී මහජනයාට පිහිට වීම.
C - අපරාධකරුවන්හට දඬුවම් නියම කිරීම.
D - ජනමාධ්‍ය සඳහා අදාළ වැඩසටහන් සංවිධානය කිරීම.

මේ අතුරෙන් ඔවුනට වඩාත් ගැළපෙන කාර්යයන් වන්නේ,

(1) A හා B ය. (2) B හා C ය. (3) C හා D ය. (4) A, B සහ D ය. (5) B, C හා D ය.

**32.** සමාජයෙන් සන්නිවේදනයටත්, සන්නිවේදනයෙන් සමාජයටත් අන්‍යෝන්‍ය වශයෙන් බලපෑම් සිදු කරනු ලබන ප්‍රබල සාධකය කුමක් ද?

(1) දේශපාලනික සාධකයයි
(2) පාරිසරික සාධකයයි
(3) නිර්මාණාත්මක සාධකයයි
(4) ආර්ථික සාධකයයි
(5) තාක්ෂණික සාධකයයි

**33.** මාධ්‍ය මගින් ප්‍රචණ්ඩත්වයට බර වූ වැඩසටහන් ඉදිරිපත් කිරීම තුළින් සිදු වන සමාජ බලපෑම පිළිබඳ පන්ති කාමරයේ දී සිසුන් අතර සංවාදයක් ඇති විය.

රහීම් :- ඒ වගේ වැඩසටහන් බලන්න සමහරු කැමතියි
රමල් :- ළමයින්ගේ ජීවිතවලට තදින් බලපාන්න පුළුවන්
කමනී :- සමහර විට ප්‍රචණ්ඩත්වය අඩු වෙන්නත් පුළුවන්
රමනී :- පවුල් අතර නැති ප්‍රශ්නත් ඇති වෙනවා

මේ අදහස් අතුරෙන් පිළිගත හැකි අදහස් ඉදිරිපත් කරන්නේ,

(1) රහීම්, රමල් සහ කමනී පමණි.
(2) රමල්, කමනී සහ රමනී පමණි.
(3) රහීම්, කමනී සහ රමනී පමණි.
(4) රහීම්, රමල් සහ රමනී පමණි.
(5) රහීම්, රමල්, කමනී සහ රමනී යන සියලු දෙනාම ය.

**34.** මාධ්‍ය දැන්වීම්කරණය පිළිබඳ ව වූ විවාදයක දී ඉස්මතු වූ කරුණුවලට අනුව එය,

A - සමාජීය අවශ්‍යතාවකි.
B - සමාජයට යහපතක් සිදු කරයි.
C - සමාජයට අයහපතක් සිදු කරයි.
D - සමාජ මත වෙනස් කරයි.

මේ අදහස්වලින්,

(1) A, B හා C පමණක් නිවැරදි වේ.
(2) A, B හා D පමණක් නිවැරදි වේ.
(3) A, C හා D පමණක් නිවැරදි වේ.
(4) B, C හා D පමණක් නිවැරදි වේ.
(5) A, B, C හා D සියල්ලම නිවැරදි වේ.

**35.** "තමන් කැමති දෙයක් කිව නොහැකි තැනක ඔහුට කිසිවක් අයිති වන්නේ ද නැත" ග්‍රීක දාර්ශනික ප්ලේටෝගේ (Plato) මේ ප්‍රකාශයෙන් කියවෙන්නේ,

(1) විසම්මුතියෙහි වටිනාකමයි.
(2) නිදහස් මතවාදයේ වැදගත්කමයි.
(3) සහෝදරත්වයේ අවශ්‍යතාවයි.
(4) සහවේදනයේ ලක්ෂණයයි.
(5) වාර්ගික සහජීවනයයි.

**36.** යම්කිසි භාෂාවක් මළ භාෂාවක් බවට පත් වීම නිසා ඇති විය හැකි බරපතළ තත්ත්වයන් පිළිබඳ ව අදහස් කිහිපයක් පහතින් දැක්වේ.

A - අදාළ ප්‍රජාවට අදහස් හුවමාරු කර ගැනීම සඳහා පවතින අවස්ථා අහිමි වේ.
B - අදාළ ප්‍රජාවේ සංස්කෘතික අනන්‍යතාව පවත්වා ගැනීමේ හැකියා ගිලිහේ.
C - අදාළ භාෂාව තුළ සඳහන් ව තිබූ දැනුම් සම්භාරය අහෝසි වේ.
D - අදාළ ප්‍රජාවන්ට ජාතියක් හෝ ජනවර්ගයක් ලෙස තිබූ පිළිගැනීම අහෝසි වේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A, B හා C පමණි.
(2) A, B හා D පමණි.
(3) A, C හා D පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C හා D සියල්ලම ය.

**37.** මානව ගුණධර්ම තේමා කරගනිමින් නිපදවා තිබූ වෘත්තාන්ත චිත්‍රපටයක් පිළිබඳ ව පුවත්පත් හා සඟරා කිහිපයක විචාර ලිපි පළවී තිබුණි. එක් පුවත්පතක පළවූ ලිපියක අඩංගු වූයේ කලාත්මක පැතිකඩ හා අභ්‍යන්තර ලක්ෂණ ඇතුළත් වූ විචාරයකි. මෙහිදී විචාරකයා භාවිත කළ විචාර ක්‍රමය කුමක් ද?
(1) සෞන්දර්යාත්මක විචාර ක්‍රමය
(2) සදාචාරාත්මක විචාර ක්‍රමය
(3) දේශපාලනික විචාර ක්‍රමය
(4) සංසන්දනාත්මක විචාර ක්‍රමය
(5) භාෂාත්මක විචාර ක්‍රමය

- අංක **38** සිට **40** තෙක් ප්‍රශ්නවලට පහත දැක්වෙන සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| | | | |
|---|---|---|---|
| A | ප්‍රජානනය | G | චරකය |
| B | නවෝත්පාදන විසරණය | H | මුඩුක්කු |
| C | මන්දපෝෂණය | I | පුරවැසියන් බලගැන්වීම |
| D | ප්‍රාමාණිකරණය | J | ස්වරාජ් |
| E | නූගත්කම | K | විරැකියාව |
| F | ස්වයං විශ්වාසය | L | අන්තර් පුද්ගල විශ්වාසය |

**38.** ඉහත සටහන අතුරෙන් පෝල් පී ස්ටීවන්ගේ නිර්වචනයට අයත් අංග වන්නේ,
(1) A, C, D හා J ය.
(2) C, E, H හා K ය.
(3) C, H, E හා L ය.
(4) C, K, E හා G ය.
(5) E, D, B හා H ය.

**39.** නායර් හා වයිට් සංවර්ධන සන්නිවේදන මාදිලියට අයත් සංකල්පවලට අදාළ වන්නේ,
(1) B, F හා D ය.
(2) D, I හා L ය.
(3) F, I හා L ය.
(4) I, J හා F ය.
(5) L, G හා A ය.

**40.** සංවර්ධනය පිළිබඳ චීන ආකෘතියට සහ මහත්මා ගාන්ධිතුමාගේ සන්නිවේදන භාවිතයට පිළිවෙළින් අයත් කාණ්ඩය වන්නේ,
(1) AB හා GI ය.
(2) AD හා GJ ය.
(3) AF හා GK ය.
(4) BD හා GJ ය.
(5) CD හා JL ය.

**41.** චිත්‍රපටයක එන දර්ශනාවලියක පළමු රූපයෙන් පුද්ගලයකුගේ මිය යෑම නිරූපණය කෙරේ. දෙවන රූපයෙන් ගං තෙරක සිටින කුරුල්ලන් පියඹා යන දර්ශනයක් වෙත ඍජුව ම ඡේදනය වේ.
මෙය නැරඹූ පියල් එම ජවනිකාවෙන් නිරූපණය වූ කිසිවක් ඔහුට වැටහී නොගිය බව පැවසී ය. ඒ සඳහා හේතු වන්නට ඇත්තේ,
(1) පියල්ට චිත්‍රපටයේ සංඥාර්ථ නිසි ලෙස කියවා ගැනීමට නොහැකි වීමයි.
(2) පියල්ට චිත්‍රපට මාධ්‍ය සංස්කෘතිය පිළිබඳ නිසි අවබෝධයක් නොතිබීමයි.
(3) පියල් සිටි ස්ථානයට චිත්‍රපටය මැනවින් දර්ශනය නොවීමයි.
(4) පියල්ට සාක්ෂරතා ඥානය නොමැති වීමයි.
(5) පියල්ට එම චිත්‍රපටයේ රූප අපැහැදිලි වීමයි.

**42.** පහත සඳහන් ප්‍රකාශයන්ගෙන් මාධ්‍ය කර්මාන්තය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) වඩාත් සංවිධානාත්මක ව ව්‍යුහයක් තුළ ක්‍රියාත්මක වීම
(2) වෙළෙඳපොළ අවශ්‍යතා මුල් කර ගනිමින් කටයුතු කිරීම
(3) පාර්ශ්ව ගණනාවක් එකතු ව සන්දේශ නිෂ්පාදනය කිරීම
(4) මාධ්‍ය ආයතන අතර තරගකාරිත්වයක් පැවතීම
(5) සැමවිට ම සමාජීය මනස ව්‍යාපාරික ආධිපත්‍යයෙන් ගළවා ගැනීම

**43.** පුවත්පතක සංස්කාරකවරයෙකුට ලැබුණු අත්පිටපතක අක්ෂර වින්‍යාසය හා ව්‍යාකරණ දෝෂ සහිත වාක්‍ය කිහිපයක් දක්නට ලැබුණි. එහි සඳහන් ව තිබූ නිවැරදි වාක්‍යය කුමක් ද?
(1) උපාධි ප්‍රධානෝත්සවයට මම සහභාගි වුනෙමි.
(2) තාත්තා ද අම්මා ද මම ද උත්සවයට ගියහ.
(3) දෙවියෝ වැනි මිනිස්සු අපි අතර වෙති.
(4) සඟරාව මුද්‍රණ ද්වාරයෙන් පිටවීම ගැන පාඨකයෝ සතුටු වූහ.
(5) කෙනෙක් එදින උත්සවයට නො පැමිණියහ.

**44.** පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න.
A - ඔබ කියන දෙය පැහැදිලි ය.
B - මම දන්න භාෂාවකින් තමයි කියන්නේ.
C - ඒ කාරණය ඉතා වටිනා එකක්.
D - අනෙක් අයගේ සහයෝගයෙන් එය ආරම්භ කරමු.
එම ප්‍රකාශවලට අනුරූප වන ශ්‍රවණ ක්‍රියාවලියේ අවස්ථා අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
(1) තේරුම් ගැනීම, ශ්‍රවණය, ඇගයීම, ප්‍රතික්‍රියාව
(2) ශ්‍රවණය, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව, ඇගයීම
(3) තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව, ඇගයීම, ශ්‍රවණය
(4) ශ්‍රවණය, ඇගයීම, තේරුම් ගැනීම, ප්‍රතික්‍රියාව
(5) ශ්‍රවණය, තේරුම් ගැනීම, ඇගයීම, ප්‍රතික්‍රියාව

**45.** පහත සඳහන් ප්‍රකාශ අතරින් **සදොස්** ප්‍රකාශය තෝරන්න.
(1) වාචික සන්නිවේදනය බොහෝ අවස්ථාවල සිදුවන්නේ අවාචික සංඥා සම්මිශ්‍ර ව ය.
(2) අපූර්වත්වය සහ චින්තනාත්මක බව නිර්මාණාත්මක සන්නිවේදනයේ විශේෂත්වයකි.
(3) සමාජයක බලකේන්ද්‍රීය ස්වභාවය සන්නිවේදනයේ ක්‍රියාකාරිත්වයට බලපෑමක් එල්ල නො කරයි.
(4) දුගීභාවයේ සංස්කෘතියෙන් ප්‍රජාව මුදවා ගැනීම සංවර්ධන සන්නිවේදනයේ ඇති අභියෝගයකි.
(5) ස්වදේශිකත්ව ඥානය ගොනු වී ඇති ප්‍රබල සන්නිවේදන ක්‍රමයක් ලෙස සිරිත් විරිත් හැඳින්විය හැකි ය.

**46.** වියුක්තිකරණය හෙවත් විභේදනය අත්‍යවශ්‍ය අන්තර්වර්තී පුද්ගල සන්නිවේදන කාර්යයක් ලෙස සැලකිය හැකි වන්නේ,
(1) පංචවිධ සංවේදන අවධානයට ලක් කිරීම සඳහා ය.
(2) සහානුභූතිය අත්පත් කර ගැනීම සඳහා ය.
(3) පංචවිධ සංවේදන වෙන් කර හඳුනා ගැනීම සඳහා ය.
(4) සාර්ථක සංජානනයක් සඳහා ය.
(5) සංකල්ප සුවිශේෂ ලෙස ගොඩනගා ගැනීම සඳහා ය.

**47.** පුරාතන සමාජයේ දෝලාවෙන් ගමන් කිරීමේ සිට නූතන සමාජයේ මෝටර් රථයෙන් ගමන් කිරීම තෙක් සිදු වූ සමාජ විපරිවර්තනය,
(1) සංස්කෘතික කම්පනයකි.
(2) සංස්කෘතික විසරණයකි.
(3) සංස්කෘතික ලැග්මකි.
(4) සංස්කෘතික ත්වරණයකි.
(5) සංස්කෘතික බාදනයකි.

**48.** ස්වදේශීය ඥාන පද්ධතිය ස්මරණය කර ගැනීම සහ සංරක්ෂණය කරගැනීම සඳහා පුරාතන පඬිවරුන් බහුල වශයෙන් භාවිත කළ ක්‍රමවේදය වූයේ, ඒවා
(1) නිර්මාණාත්මක ප්‍රකාශන බවට පත් කිරීම ය.
(2) චිත්‍ත සිතුවම් බවට පරිවර්තනය කිරීම ය.
(3) සාරාංශ කර ස්මරණයෙහි තබා ගැනීම ය.
(4) ඛණ්ඩනය කොට ග්‍රන්ථකරණය කිරීම ය.
(5) තාර්කික රටාවන්ට අනුව පෙළ ගැස්වීම ය.

**49.** සිය ඉල්ලීම් දිනා ගැනීම සඳහා දිගු කාලයක් ඉල්ලීම් කර එය අසාර්ථක වූ පසු පුද්ගලයෙකු ඊට විරෝධය පෑම සඳහා ප්‍රසිද්ධියේ රජයේ ගොඩනැගිල්ලක වහලය මත මාරාන්තික උපවාසයක් ආරම්භ කරන බවට රූපවාහිනී මාධ්‍යවේදියෙකුට දැනගන්නට ලැබිණ. සමාජ හිතකාමී පුවත් සෙවීම තම වගකීම කර ගත් මාධ්‍යවේදියකු ලෙස ඔහු/ඇය මෙහි දී කළ යුතුව තිබුණේ කුමක් ද?

(1) අදාළ පුද්ගලයා පිළිබඳ ව පොලිසියට දැනුම් දී සිද්ධියට පෙර ඔහු අත්අඩංගුවට ගැනීමට කටයුතු කිරීම.
(2) මාරාන්තික උපවාසයට තැත් කිරීමේ උත්සාහය වළකාලමින් ඔහුගේ ඉල්ලීම් සඳහා මාධ්‍ය මගින් හඬක් නිර්මාණය කිරීම.
(3) සිදුවීම උපරිම ලෙස ආවරණය කර වහා මාධ්‍ය වෙත උණුසුම් පුවත් ලබා දීමට අදහස් කිරීම
(4) වෙනත් මාධ්‍ය ආයතන වාර්තාකරුවන් උපක්‍රමික ව වළක්වා වාර්තාකරණයේ ප්‍රමුඛයා බවට පත්වීමට කටයුතු කිරීම.
(5) බලධාරීන් කළ වරද ඉස්මතු කිරීම සඳහා මාරාන්තික උපවාසයේ යෙදීමට තැත් කළ පුද්ගලයාගේ ප්‍රකාශනයක් රූගත කර ගැනීමට උනන්දු වීම.

**50.** මාධ්‍ය හා ගෝලීයකරණය පිළිබඳ ව පාසල් මාධ්‍ය සමාජයක පවත්වන ලද සාකච්ඡාවක දී උසස් පෙළ සිසුන් කිහිපදෙනකු ඉදිරිපත් කළ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

මධූෂි :- ගෝලීයකරණයේ ව්‍යාප්තියට මාධ්‍ය පිටිවහලක් වුනා
රේණුකා :- වාණිජ කර්මාන්තයේ කාලීන අවශ්‍යතාවක් ලෙසට මාධ්‍ය සංස්කෘතිය හඳුන්වන්න පුළුවන්
මේනකා :- ජනමාධ්‍ය සංස්කෘතියෙන් සංතෘප්ත කරන ජනතාවට එහි බලපෑම ගැන දැනුවත්කමක් නැහැ
ප්‍රබෝධනී :- මාධ්‍ය සිය වෙළෙඳපොළ ව්‍යාප්ත කිරීම සඳහා සාම්ප්‍රදායික අදහස් උපයෝගි කර ගන්නේ නැහැ

ඉහත ප්‍රකාශ අතුරෙන්,

(1) මධූෂි, රේණුකා හා මේනකාගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(2) රේණුකා, මේනකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(3) මධූෂි, මේනකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(4) මධූෂි, රේණුකා හා ප්‍රබෝධනීගේ ප්‍රකාශ පමණක් නිවැරදි වේ.
(5) මධූෂි, රේණුකා, මේනකා හා ප්‍රබෝධනී යන සියලු දෙනාගේ ම ප්‍රකාශ නිවැරදි වේ.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව/පැරණි නිර්දේශය – புதிய/பழைய பாடத்திட்டம் – New/Old Syllabus

NEW/OLD

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2019 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தரப்) பரீட்சை, 2019 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2019

සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II
தொடர்பாடலும் ஊடகக் கற்கையும் II
Communication & Media Studies II

29 S II

2019.08.31 / 0830 - 1140

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

**උපදෙස්:**

✻ ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට හිමි ලකුණු සංඛ්‍යාව **20**කි.

**1.** සන්නිවේදන විෂය ක්ෂේත්‍රයේ සංකීර්ණත්වය සන්නිවේදන ආකෘතිවලින් පැහැදිලි වේ.

(i) මුල් කාලීන සන්නිවේදන ආකෘති අතර දක්නට නොලැබෙන හැරල්ඩ් ඩී. ලැස්වෙල්ගේ ආකෘතියෙහි දැකිය හැකි සුවිශේෂී මූලිකාංගය නම් කොට ඒ පිළිබඳ ව කෙටි හැඳින්වීමක් කරන්න.

(ii) ඔස්ගුඩ් සහ ශ්‍රාම් ඉදිරිපත් කළ ආකෘතියට අනුව විකේතිකරය, ආකේතිකරය බවට පත්වීමට හේතු වන සාධකය නම් කොට එහි ඇති වැදගත්කම පිළිබඳ ව පැහැදිලි කරන්න.

(iii) දෙපියවර සන්නිවේදන ආකෘතියට අනුව තොරතුරු ගලනය වන ආකාරය රූප සටහනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iv) සන්නිවේදන ක්‍රියාවලියේ ජීව විද්‍යාත්මක පදනම හඳුනා ගැනීමට පාදක වන බර්ලෝගේ සන්නිවේදන ආකෘතියට අයත් සාධක **හතරක්** පැහැදිලි කරන්න.

**2.** මිනිසාගේ භාෂා භාවිතය, සංඥා සංකේත හා ජන කලාවන්ගේ ඇසුර නිර්මාණාත්මක සන්නිවේදනයට බලපා තිබේ. ජනමාධ්‍ය තුළින් ද එය ප්‍රකට වේ.

(i) පුවත්පත් මාධ්‍ය තුළ භාෂා භාවිතයේ දී දක්නට ලැබෙන දෝෂ **හතරක්** නම් කරන්න.

(ii) රූපවාහිනියේ ප්‍රචාරය වන කිරි පිටි දැන්වීම් මගින් පාරිභෝගිකයාට සිදු විය හැකි බලපෑම පිළිබඳව කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iii) පාසල් මාධ්‍ය සමාජයකින් ඉදිරිපත් කළ හැකි නිර්මාණ ව්‍යාපෘති **හතරක්** නම් කර, එබඳු ව්‍යාපෘතිවලින් පාසලට සහ සිසු සිසුවියන්ට ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** පිළිබඳ ව කෙටියෙන් පැහැදිලි කරන්න.

(iv) දරුවන්ට අධ්‍යාපනය ලබාදීමේ දී ජනකතා යොදා ගැනීමේ වැදගත්කමට අදාළ කරුණු **හතරක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

**3.** (i) සංවර්ධන සන්නිවේදනයේ දී සාම්ප්‍රදායික මාධ්‍ය යොදා ගැනීමේ වාසි **හතරක්** නම් කරන්න.

(ii) ප්‍රචණ්ඩත්වය පුවත්පත් මාධ්‍ය තුළ නිරූපණය වන ආකාර **හතරක්** දක්වා, ඉන් **එකක්** ගැන විස්තර කරන්න.

(iii) දුර්වල ශ්‍රවණ හැකියාවක් ඇති වීමට හේතුවන කරුණු **තුනක්** නිදසුන් සහිත ව පැහැදිලි කරන්න.

(iv) 'ඕපාදූපදාමය' කෙටියෙන් හඳුන්වා ඕපාදූප පාදක කොට ගෙන සමාජ ගැටුම් ඇති විය හැකි ආකාරය පිළිබඳ කරුණු **තුනක්** නිදසුන් ඇසුරෙන් පැහැදිලි කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**4.** (i) අන්තර්වර්ති පුද්ගල සන්නිවේදනය ප්‍රශස්ත ව පවත්වාගැනීම සඳහා ප්‍රගුණ කළ යුතු නිපුණතා **හතරක්** නම් කරන්න.

(ii) "පුවත්පත් නිර්මාණාත්මක සන්නිවේදනයේ මූලාරම්භයන්ගෙන් එකකි." ඉහත අදහස තහවුරු කිරීමට කරුණු **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(iii) "ජනප්‍රිය සංස්කෘතිය සමාජ පරිහානිය කෙරෙහි ද බලපෑ හැකි ය." මෙම අදහසට පක්ෂ ව කරුණු **තුනක්** ඇසුරෙන් විවරණයක් කරන්න.

(iv) "ගැටුම් සමාජයේ ප්‍රගමනයට ආධාරකයකි."

ඉහත තේමාව යටතේ ඊට පක්ෂ ව කරුණු **දෙකක්** හා විපක්ෂ ව කරුණු **දෙකක්** පදනම් කර ගනිමින් පාසල් සඟරාවකට වචන 250කට නොඅඩු ලිපියක් සකස් කරන්න.

**5.** "සමාජයක යහපැවැත්ම උදෙසා මාධ්‍ය පුළුල් කාර්යභාරයක් ඉටු කරයි."

(i) බහුසංස්කෘතික සමාජයක සහජීවනය සඳහා මාධ්‍ය කටයුතු කළ යුතු ආකාර **හතරක්** නම් කරන්න.

(ii) සන්නිවේදනය සමාජය සඳහා වැදගත් වන ආකාරය පිළිබඳ කරුණු **හතරක්** නම් කොට, ඉන් **දෙකක්** පිළිබඳ ව විස්තර කරන්න.

(iii) විවිධ ආගමික උපසංස්කෘතීන්ට අයත් පවුල් අතර මහජන සම්බන්ධතාව ප්‍රවර්ධනය සඳහා උපයෝගී වන ආගමික උත්සව **දෙකක්** නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.

(iv) සමාජය තුළ සාමය පවත්වා ගැනීම සඳහා ඔබ කැමති ඕනෑ ම ආගමකට අයත් **ඉගැන්වීම් දෙකක්** හඳුන්වා ඉන් **එකකට** නිදසුන් **දෙක** බැගින් ගෙන එහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

**6.** (i) ජාතික වශයෙන් අර්බුධාත්මක අවස්ථාවල දී රජය විසින් මාධ්‍ය සන්දේශ වාරණය භාවිතයට ගනු ලබයි. සමාජ මාධ්‍ය වාරණය කිරීම නිසා සමාජයට සිදු වූ යහපතට සහ අයහපතට අදාළ ව කරුණු **දෙක** බැගින් නම් කරන්න.

(ii) මහජන සම්බන්ධතා කටයුතු සඳහා ෆේස්බුක් (Facebook) මගින් ලබා ගත හැකි ප්‍රයෝජන **හතරක්** දක්වා ඉන් **එකක්** පැහැදිලි කරන්න.

(iii) "ප්‍රස්තාව පිරුළු ස්වදේශීය දැනුම හා ප්‍රඥාව පිළිබිඹු කරයි." ප්‍රස්තාව පිරුළුවල පවතින සන්නිවේදනාත්මක වැදගත්කම කරුණු **තුනක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

(iv) සංවර්ධන ව්‍යාපෘතියක දී ඇගයුම් ක්‍රියාවලියෙන් අපේක්ෂා කරන්නේ කුමක් ද යන්න කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න.

**7.** සන්නිවේදන ක්‍රියාවලියේ දී මෙන් ම විචාර ක්ෂේත්‍රයේ දී ද මාධ්‍ය සාක්ෂරතාව වැදගත් වේ.

(i) මාධ්‍ය සාක්ෂරතාවෙහි ප්‍රධාන සංකල්ප **හතරක්** දක්වන්න.

(ii) වර්තමානයේ මාධ්‍ය දේශ දේශාන්තර ව බලපෑම් කිරීමේ සාධකයක් බවට පත් ව ඇත. ගෝලීය මාධ්‍ය ජාතික සංස්කෘතිය කෙරෙහි බලපා ඇති අයුරු කරුණු **දෙකක්** ඇසුරෙන් විචාරශීලී ව විස්තර කරන්න.

(iii) මාධ්‍ය සාක්ෂරතාව නිපුණතා පාදක වූවකි. එවන් නිපුණතා **තුනක්** විස්තර කරන්න.

(iv) ගෝලීය සංස්කෘතිය, ජාතික සංස්කෘතිය කෙරෙහි බලපෑනු ලබන ආකාරය පිළිබඳ ව කරුණු **හතරක්** රූපවාහිනී මාධ්‍යය පදනම් කර ගනිමින් විග්‍රහ කරන්න.

* * *